Article 12(1)

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019-02-08 |

පැමිණිලිකරු : ඩබ්.පී.පී.එන්. පෙරේරා මයා.
174/8, ඇතුලත මල් පාර,
කොළඹ 03.

වගඋත්තරකරු : විදුහල්පති
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

<u>පැමිණිලි අංක : HRC/368/18</u>

පැමිණිල්ල : -

මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන වර්ණකුල පටබැඳිගේ ප්‍රශාන් නිරෝෂන පෙරේරා යන අය 2018.02.02 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, ඩබ්.පී. යෙසත් හේණුක පෙරේරා නැමැති තම දරුවා කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ 22/2017 දරණ චක්‍රලේඛනයට අනුව අයදුම්පත් ඉදිරිපත් කරන ලද නමුත් තම දරුවා පාසලට ඇතුලත් කර නොගත් බවයි.

ඒ අනුව තම දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කර ගැනීමට නිර්දේශ කරන ලෙසත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය උල්ලංඝනය වී ඇති බවට නිර්දේශ කරන ලෙසත් මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

පැමිණිලිකරුගේ මුල් පැමිණිල්ල සමග සවිස්තරාත්මක ලිපියක් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද 22/2017 චක්‍රලේඛනය සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිටීමෙන් අනතුරුව අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කළ 2017.08.27 දිනැති අභියාචනයද අමුණා ඇත. මෙම කාරණාව පිළිබඳ කොමිෂන් සභාව පරීක්ෂණයක් සිදු කිරීමට තීරණය කර 2018.05.10 වන දින පෙනී සිටින ලෙස දෙපාර්ශවයට සිතාසි නිකුත් කර ඇති අතර, එම පරීක්ෂණය සඳහා



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575, 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වගඋත්තරකාර විද්‍යාලයේ විදුහල්පති වෙනුවෙන් සහකාර විදුහල්පතිවරයෙකු පෙනී සිට ඇත. පැමිණිලිකරු පරීක්ෂණය සඳහා සහභාගී වී නොමැත. ඉන් අනතුරුව නැවත වතාවක් 2018.06.04 වන දින පරීක්ෂණය සඳහා පාර්ශවකරුවන්ට සිතාසි යොමු කර ඇතත් පරීක්ෂණය සඳහා පැමිණිලිකරු සහ ඔහුගේ නීතිඥවරයා පමණක් පැමිණ ඇත. වගඋත්තරකරු පැමිණ නොමැත.

තුන්වන වරටත් පාර්ශවකරුවන්ට 2018.10.09 වන දින පෙනී සිටින ලෙසට සිතාසි යොමු කර ඇතත්, එදිනද පැමිණිලිකරු සහ ඔහුගේ නීතිඥවරයා පමණක් පැමිණ ඇත. වගඋත්තරකාර පාර්ශවය පැමිණ නොමැත. ඉහත කී අවස්ථා තුනෙන් අවසාන අවස්ථා දෙකෙහිදී වගඋත්තරකාර පාර්ශවය කිසිදු දැනුම් දීමකින් තොරව කොමිෂන් සභාවේ සිතාසිය මග හරිමින් සිටින බව පෙනී යන හෙයින් හා මෙම කාරණාව දරුවෙකුගේ අධ්‍යාපනය පිළිබඳ කාරණාවක් බැවින් තවදුරටත් පරීක්ෂණයක් නොකර මේ පිළිබඳව නිර්දේශයක් නිකුත් කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය සහ නිරීක්ෂණ :-**

2018.10.09 වන දින පැවැත්වූ පරීක්ෂණයේදී පැමිණිලිකරු විසින්, ඔහුගේ වාචික කරුණු දැක්වීම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම කාරණා පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙසට දැනුම් දී ඇත. එම දැනුම් දීමට අනුව පැමිණිලිකරු විසින් ඔහුගේ 2018.10.16 වන දින දිවුරුම් ප්‍රකාශය අනෙකුත් ලේඛනද සමග කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

මෙම පැමිණිලිකරු ඔහුගේ දරුවාව කොළඹ රාජකීය විද්‍යාලයට 2018 වර්ෂයට ඇතුළත් කිරීම සඳහා ස්ථාන මාරු පදනම යටතේ අයදුම්පත්‍රයක් ලියාපදිංචි තැපෑලෙන් යොමු කර ඇති අතර, ඉන් අනතුරුව සම්මුඛ පරීක්ෂණය සඳහා 2017.08.26 වන දින සහභාගී වී ඇත. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරු විසින් අයදුම්පත්‍රය සමග පදිංචිය තහවුරු කිරීම සඳහා අමුණා තිබූ බදු ඔප්පුව ලියාපදිංචි කර නොමැති වීම මත මින් ඉදිරියට ඔහුගේ අයදුම්පත්‍රය සලකා බැලීමක් සිදු නොකරන බවට දක්වා ඇත. මෙම අවස්ථාවේදී පැමිණිලිකරු ලියාපදිංචි බදු ඔප්පුවක අවශ්‍යතාවයක් නොමැති බව කියා සිටියද එය විදුහල්පතිවරයා විසින් ප්‍රතික්ෂේප කර ඇති බවද සඳහන් වේ.

ඉන් අනතුරුව පැමිණිලිකරු අභියාචනා මණ්ඩලය වෙත මේ පිළිබඳව අභියාචනාවක් ඉදිරිපත් කර ඇති අතර, එම අභියාචනා මණ්ඩලයෙන් පැමිණිලිකරුගේ අභියාචනාව නැවත සලකා බැලීමකින් තොරව ප්‍රතික්ෂේප කර ඇත. තවදුරටත් පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා මණ්ඩලයෙන් ඔහුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වීමෙන් අනතුරුව ඔහුගේ නීතිඥවරයා විසින් 2018.02.05 වන දින විදුහල්පතිවරයා වෙත ලිපියක් යොමු කරමින් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ශ්‍රී ලංකා නීතිය තුළ ලේඛනයක් ලියාපදිංචි කිරීම අනිවාර්යය කාරණය නොවන බව නීතිය පිළිගෙන ඇති බවට දන්වන ලද බවද සඳහන් කර ඇත. එසේම ස්ථාන

මාරු පදනම මත කොළඹ රාජකීය විද්‍යාලයට ඔහු විසින් යොමු කරන ලද අයදුම්පත්‍රය සඳහා නිශ්චිතව ලකුණු 95 ක ප්‍රමාණයක් ඔහුට ලැබිය යුතු බවද. තවදුරටත් පැමිණිලිකරු විසින් කියා සිටී. තවද 22/2017 චක්‍රලේඛනයට අනුගතව. නිශ්චිත ස්ථාන මාරුවට (දුර අනුව) උපරිමය වන ලකුණු 40 ක ප්‍රමාණයක්ද. පදිංචිය සඳහා ලකුණු 30 ක ප්‍රමාණයක්ද. සේවා කාලය සඳහා ලකුණු 10 ක්ද. ස්ථාන මාරු ලැබ ගත වූ කාලය සඳහා ලකුණු 5 ක්ද. ලබා නොගත් නිවාඩු සඳහා ලකුණු 10 ක්ද වශයෙන් ලැබිය යුතු බවද සඳහන් කර ඇත.

ඉහත කී පැමිණිලිකරුගේ වාචික කරුණු ඉදිරිපත් කිරීම් සහ දිවුරුම් සහතිකයේ ඔහු විසින් ඉදිරිපත් කරන තොරතුරු වලට අනුකූලව 22/2017 චක්‍රලේඛනයේ විධිවිධාන වලට අනුව පැමිණිලිකරුට ඔහු සඳහන් කරන ආකාරයේ සම්පූර්ණ ලකුණු 95 ක් ලැබිය යුතුද යන්න කොමිෂන් සභාවේ විමසීමට ලක්කොට ඇත.

ඒ අනුව 22/2017 චක්‍රලේඛනයේ 7.6 රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම ලැබූ රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය බැංකු නිලධාරින්ගේ දරුවන් යන පදනමෙහි 7.6.1 යටතේ " පෙර සේවා ස්ථානයේ සිට ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇති නව සේවා ස්ථානය අතර දුර (කෙටිම. පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතුය)" යන කාරණ කෙරෙහි අවධානය යොමු කිරීමේදී,

නාවික හමුදාපති වෙනුවට සහකාර ලේකම් 1 ලුතිනන් කමාන්ඩර් කේ.ඩබ්.ආර්.එල්.පෙරේරා යන අය කොළඹ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත එවා ඇති 2018.06.28 දිනැති ලිපිය ප්‍රකාරව මෙම පැමිණිලිකරු ත්‍රිකුණාමල නාවික කඳවුරේ සේවය කර කොළඹ රංගල ; කඳවුර වෙතට ස්ථාන මාරු ලබා පැමිණ ඇති බවට දක්වා තිබීම මගින් පැමිණිලිකරුගේ පැරණි සේවා ස්ථානයේ සිට නව සේවා ස්ථානය වෙතට කිලෝමීටර් 150 කට වැඩි දුරක් පවතින බව නිරීක්ෂණය වේ. ඒ අනුව එම නිර්ණායකය සඳහා පැමිණිලිකරු වෙත ලකුණු 40 ක් ලැබිය යුතු බව නිරීක්ෂණය වේ.

එසේම, එම චක්‍රලේඛනයේ 7.6.2 යටතේ වන "ස්ථාන මාරුවීම ලැබ පැමිණ පදිංචි වූ ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය (පදිංචිය සනාථ කර ගත යුතුයි)" යන්න සලකා බැලීමේදී, නීතිඥ ගාමිණී ප්‍රනාන්දු විසින් ලියා ඇති බදු ඔප්පුව සහ ග්‍රාම නිලධාරිවරයා විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකයේ පැමිණිලිකරු අංක 174/8. ඇතුලත මල් පාර. කොළඹ 03 හි පදිංචි වී සිටින බව තහවුරු කර ඇත. ඒ අනුව කොළඹ මහනාම විදුහලට ලකුණු 5 ක් අඩුකර පැමිණිලිකරු වෙත ලකුණු 30 ක් ලබා දිය යුතු බව නිරීක්ෂණය වේ .

තවද. 7.6.3 හි "රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/බැංකු සේවකයෙකු ලෙස සේවා කාලය වසරකට එක් ලකුණක් බැගින්" යන නිර්ණායකය යටතේ මෙම පැමිණිලිකරු 2003.10.05 වන දින ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය සේවයට බැදී ඇති අතර, ඔහු මේ වන විට අවුරුදු 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හෙයින් ඔහුට උපරිම ලකුණු 10 ක් ලැබිය යුතු බව නිරීක්ෂණය වේ.

චක්‍රලේඛයේ 7.6.4 පරිදි "ස්ථාන මාරුවීම් ලැබ ගත වූ කාලය (අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට)" යන්න විමසා බැලීමේදී මෙම පැමිණිලිකරු 2017.06.05 වන දින ස්ථාන මාරු ලබා ඇති හෙයින් එය වර්ෂයක කාලයක් සඳහා පැමිණිලිකරුට ලකුණු 5 ක් ලැබිය යුතු බවද නිරීක්ෂණය වේ.

එසේම 7.6.5 යටතේ "ලබා ගත් නිවාඩු (ඉල්ලුම්පත්‍ර භාර ගන්නා වර්ෂයට පෙර වසර 5 ක් සඳහා ලීත් වර්ෂය තුළ ලබා නොගත් නිවාඩු දින 20 ට ලකුණු 2 ක බැගින් උපරිම ලකුණු 10 ක්) සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී පැමිණිලිකරුගේ නිවාඩු විස්තර ඇතුළත් වූ කපිතාන් ජේ.එම්.එස්.සෙනවිරත්න විසින් කොළඹ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් එවා ඇති 2017.06.22 දිනැති ලිපිය අනුව පැමිණිලිකරුට ලකුණු 10 ක උපරිමය ලැබිය යුතු බවද නිරීක්ෂණය වේ.

මේ ආකාරයෙන් සම්පූර්ණ ලකුණු එකතු කිරීමේදී පැමිණිලිකරුට ලැබිය යුතු මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 95 ක් වන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

එසේම පාසැල්වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගැනීමේ අංක 17/2016 දරණ චක්‍රලේඛණයෙහි 7.1.3 වගන්තියට කෙරෙහි අවධානය යොමු කිරීමේදී "මෙම ගණ සඳහා ලකුණු ක්‍රමයකට අනුව ලකුණු ලබාදෙන බැවින් ලකුණු ලබා දීමේ පටිපාටියේ එක් කොටසකට ලකුණු ලබා නොගත්තද, ලකුණු හිමිවන අනෙකුත් කොටස් සඳහා ලකුණු ලබාදිය යුතු අතර, එවැනි අවස්ථා වල එම ගණ සඳහා සම්පූර්ණයෙන්ම ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප නොකළ යුතුය" යනුවෙන් දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ හිමිකම් ඔප්පුව ලියාපදිංචි නොකළ ඔප්පුවක් වීම මත අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත.

**නිගමනය :-**

ඉහත කරුණු අධ්‍යයනය කිරීමේදී පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය තවදුරටත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හෝ අභියාචනා මණ්ඩලය විසින් සැලකිල්ලට ලක් කළේ නම් පැමිණිලිකරුට මෙම ලකුණු 95 ලැබිය යුතු බව ඉදිරිපත් වී ඇති කරුණු අනුව පෙනී යයි. තවද මෙම අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ බදු ඔප්පුව ලියාපදිංචි නොකර ඇති බව නොසැලකිය යුතු බව 22/2017 චක්‍රලේඛනය තුළ කිසිසෙත්ම සඳහන් වී නොමැත. තවද ලියාපදිංචි බදු ඔප්පුව සහ ලියාපදිංචි නොකළ බදු ඔප්පුව පිළිබඳව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ප්‍රමුඛත්වය දිය යුතු අවස්ථාවක් නොවන බවද කොමිෂන් සභාවේ මතයයි.

මෙකී සමස්ත කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය සමග අමුණා ඇති සියලු ලේඛන නිවැරැදිව තිබියදීත් බදු ඔප්පුව ලියාපදිංචි නොකිරීම යන කාරණය මතම පදනම්ව පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය සම්පූර්ණයෙන්ම නොසලකා හැරීම තුළ පැමිණිලිකරුට අගතියක් වී ඇති බවත්

පැමිණිලිකරුගේ දරුවාට වගඋත්තරකාර විදුහලේ අධ්‍යාපනය හැදෑරීමට තිබූ නීත්‍යානුකූල අවස්ථාව අහිමි වී ඇති බවත් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පරිදි පැමිණිලි පාර්ශවීය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව ඩබ්.පී. යෙසත් හේණුක පෙරේරා නැමැති පැමිණිලිකරුගේ දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2018 වර්ෂයේ 1 වන ශ්‍රේණියට (2019 වර්ෂයේ දෙවන ශ්‍රේණියට) ඇතුලත් කර ගන්නා ලෙස වගඋත්තර පාර්ශවය වෙත මෙයින් සිටිමු.

2019.02.28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. ගරු අමාත්‍යතුමා,
   අධ්‍යාපන අමාත්‍යංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/R-6